සැ. යු.- 2010.11.12 වැනි දින පළ වූ අංක 1,680 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,681 - 2010 නොවැම්බර් මස 19 වැනි සිකුරාදා - 2010.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණයේ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | 892 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 892 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 නොවැම්බර් මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 නොවැම්බර් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පිස්කල් වෙන්දේසියේ විකිණීම්

**කොළඹ දිසා අධිකරණයේ දී ය.**

කොළඹ 2, හයිඩ්පාක් කෝනර්, අංක 97, ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී, පෙර කොළඹ 1, ජනාධිපති මාවතේ අංක 69, සෙලින්කෝ මන්දිරයේ 3 වන මහලේ පිහිටි සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම.

නඩු අංකය : 17675/එම්බී
මහනුවර දිසා අධිකරණය ඇස්කීසී අංක 114/10

..........................................පැමිණිලිකරු

- එදිරිව -

(1) මැණික්හින්න, හීපිටිය, අංක 30/3 හි පදිංචි උපාසක ගෙදර නයනා ශ්‍රියානි ප්‍රේමදාස.

(2) මැණික්හින්න, හීපිටිය, අංක 30/3 හි පදිංචි දොරගමුව පිහිල්ල පිටියේ ගේදර ධර්මසිරි.

....................................... විත්තිකරුවන්.

ඉහත අංක දරන නඩු වාර්තාවේ ඇතුළත් කර ඇති වර්ෂ 2008.02.22 දිනැති තීන්දු ප්‍රකාශය මගින් ඉහත විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට රුපියල් එක්ලක්ෂ තිස් හය දහස් දෙසිය විසි පහයි ශත තිහක (රු. 1,36,225.30) මුදලක් වර්ෂ 2005.04.30 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා මසකට 3%ක් බැගින් පොලිය ද, එතැන් සිට තීන්දු ප්‍රකාශිත මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් සමස්ථ මුදල සඳහා පොලිය ද, නඩු ගාස්තු ද, ඒ සඳහා තවදුරටත් පොලිය හා ගාස්තු අයකර ගැනීමට ආඥා කොට ඇති බැවින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කේ. පතිරාජ විසින් සහතික කල වර්ෂ 2001.07.31 දිනැති අංක 4081 දරන බැඳුම්කරය පදනම් කර ගෙන ඉහත කී රු. 1,36,225.30ක මුදල හා වැඩිදුර පොලිය ද, නඩු ගාස්තු ද යන එකී මුදලින් දැනට කිසිම මුදලක් ගෙවා නොමැති බැවින් විත්තිකරුවන් ගෙන් අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපල එකී ඉහත විස්තර කර ඇති දේපලට අයත් සියලුම අයිතිවාසිකම් පරවශ්‍යතා සහ අනුබද්ධිතයන්ද විත්තිකරුවන්ගෙන් කවර ආකාරයන් හෝ සියලු අයිතිවාසිකම් හිමිකම් බලපුලුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපලෙන් උපදන සහ එකතු වන සියලු කුලී ලාභ සහ අතිකුත් ආදායම් ද සියලු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද, ඇතුලුව මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපල නිශ්චිතවම බැඳී ඇති බව හා ඇස්කිසි කලහැකි බව ප්‍රකාශ කරන ලද හෙයින් ද, අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසි වලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල.

වර්ෂ 2010ක් වූ දෙසැම්බර් මස 22 වැනි දින ප. ව. 2.30ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුගම්පහ කෝරළේ, පාතදුම්බර කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවේ පිහිටි අතරගල්ල, පල්ලේගම හීපිටිය හි පිහිටි ගල්කන්දේහේන නැමති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. එම්. එස්. එම්. බී. විජේකෝන් විසින් වර්ෂ 2001.07.18 වැනි දින බෙදා වෙන්කර මැන සාදන ලද අංක 1544 දරන පිඹුරේ කැබලි අංක 1 දරන කොටසට (වර්ෂ 1991.09.13 වැනි දින ඉඩමට බලයලත් මානක ඒ. ආර්. එම්. එම්. රත්නායක විසින් නැවත සකසන ලද අංක 537 දරන පිඹුරේ කැබලි අංක 13හි කොටසකි) මායිම් ; උතුරට : අංක 537 දරන පිඹුරේ කැබලි අංක 12 සහ අංක 537 දරන පිඹුරේ කැබලි අංක 13හි කොටසින් ද, නැගෙනහිරට : අංක 537 දරන පිඹුරේ කැබලි අංක 13හි කොටස සහ ප්‍රාදේශීය සභා පාර ද, දකුණට සහ බස්නාහිරට : අඩි පාර ද, යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තුනයි දශම දෙකයි නමයක් හෝ හෙක්ටයාර් 01095ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු යන සියලුම දේද සමඟ වේ. මෙම ඉඩමට අදාළ සියලුම මාර්ග අයිතීන් ද අයත් වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 588/221හි යථා පරිදි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර් පිස්කල්,
දිසා අධිකරණය - මහනුවර.

වර්ෂ 2010ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින,
මහනුවර දිසා අධිකරණයේ දී ය.

11-552

---

# විවිධ දැන්වීම්

**(සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන)**
**කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.**

නඩු අංකය : HC/Civil/47/2010/C0

කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස් පාර, මුක්තාර් ප්ලාසා, පළමුවන, දෙවන තට්ටුව, අංක 78 දරන ස්ථානයේ ජී. ඇන්ඩ් එස්. මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණයේ දී ය.

2007 අංක 7 දරන සමාගම් පනතේ xii වැනි කොටස යටතේ අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක කාරණයේ දී, කෝට්ස් ත්‍රේඩ් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, 02 වැනි තට්ටුව, අංක 123, බෞද්ධාලෝක මාවත, කොළඹ 04.

....................................... පෙත්සම්කරු

ඉහත නම් සඳහන් සමාගම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් කොළඹ 04, බෞද්ධාලෝක මාවත, අංක 123, 02 වැනි තට්ටුව හි පිහිටි කෝට්ස් ත්‍රේඩ් එක්ස්පෝට්ස්

(ප්‍රයිවට්) ලිමිටඩ් විසින් වර්ෂ 2010ක් වූ ජූලි මස 30 වැනි දින පෙත්සමක් ඉදිරිපත් කර ඇති බවත්, එකී පෙත්සම වර්ෂ 2010ක් වූ දෙසැම්බර් මස 06 වැනි දින අධිකරණය ඉදිරියේ දී විභාග කිරීමට විධාන කෙරුණු බවත්, එම පෙත්සමට අදාළව නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැලකර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණය හිමියන් හෝ සහදයකයෙක් වේ නම් ඒ සඳහා තමාම හෝ සිය නීති උපදේශකවරයා හෝ නීතිඥවරයා මඟින් එම විභාගය පවත්වන අවස්ථාවේ දී පෙනී සිටිය හැකි බවත්, එකී පෙත්සමේ පිටපතක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියකුට හෝ සහදායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන් කළේ :- සුදත් පෙරේරා ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥවරු,
අංක 51, කස්සප පාර,
කොළඹ 05.

*සටහන.-* එකී පෙත්සම විභාග කරන අවස්ථාවේදී පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතොත් එසේ කිරීමට තමා අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් සුදත් පෙරේරා ඇසෝෂියේට්ස් සමාගම වෙත ගෙනැවිත් බාර දිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් නම්, එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ 2010ක් වූ දෙසැම්බර් මස 04 වැනි දින පස්වරු 1.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනැවිත් භාර දිය යුතු ය. නැතහොත් එපරිදි තැපෑලෙන් එවිය යුතු ය.

සුදත් පෙරේරා ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥවරු.

අංක 51, කස්සප පාර,
කොළඹ 05.

11-389

**හේදන් අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

කමලා රණතුංග වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ හේදන් අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි.

1. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ආරම්භ කිරීම.
   ළමා උද්‍යාන පිහිටුවීම සහ පුස්තකාල පිහිටුවීම හා පවත්වාගෙන යාම.
2. දෙමාපියන් අහිමි, අඩු ආදායම්ලාභී සහ විදේශ රැකියාවල නියුක්ත මව්වරුන්ගේ දරුවන්ට, නේවාසිකව අධ්‍යාපන පහසුකම් සැලැස්වීම.
3. ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනය ලබාදීම සඳහා පහසුකම් සැලැස්වීම, අධ්‍යාපන මධ්‍යස්ථාන පිහිටුවීම සහ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ආරම්භ කිරීම.

යනාදිය වේ.

කමලා රණතුංග,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

11-447

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.